පේදුරුතුඩුව නගර සභාව
යාපනය දිස්ත්‍රික්කය.
-----------------------------------

1. මූල්‍ය ප්‍රකාශ
--------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම.
-------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2014 මාර්තු 10 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබූ අතර, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 මාර්තු 25 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව 2014 දෙසැම්බර් 19 දින සභාවේ සභාපති වෙත ඉදිරිපත් කරන ලදි.

1.2 මතය
----------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශ වලින් 2013 දෙසැම්බර් 31 දිනට පේදුරුතුඩුව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුව සත්‍ය හා සාධාරණ තත්ත්වය පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 ගිණුම් ප්‍රකාශ පිළිබඳවා අදහස් දැක්වීම.
------------------------------------------

1.3.1 ගිණුම්කරණ ඌණතා.
----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

(i.) ගිණුම් ප්‍රකාශවල නිරීක්ෂණය වූ ඌනතා වත්කම්, බැරකම් සහ ආදායම් වශයෙන් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| මූල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපෑම | වත්කම් | | බැරකම් | | ආදායම් | |
|---|---|---|---|---|---|---|
| | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනාකම |
| | | රු. | | රු. | | රු. |
| අඩුවෙන් දැක්වීම | 03 | 2,647,232 | 01 | 20,425,119 | 01 | 29,450 |
| වැඩියෙන් දැක්වීම | 01 | 149,922 | 01 | 34,404,489 | - | - |
| අත්හැරීම | | | 01 | 25,572 | | |

(ii.) සභාව වෙත පරිත්‍යාග කරනු ලැබූ සහ සභාව විසින් නඩු පවරන ලද වාහන 11 ක අගය තක්සේරු කර ගිණුම්ගත කර නොතිබූ බැවින් වාහන අගය අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැතිකම.
---------------------------------------
විගණනය සඳහා අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා රු.13,006,084 ක් වූ ගනුදෙනු විගණනයේදි සත්‍යනිරීක්ෂණය කළ නොහැකි විය.

1.3.3 අනුකූල නොවීම්
------------------
පහත සඳහන් නීති,රීති,රෙගුලාසි සහ කළමනාකාරීත්ව තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදි නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම් |
|---|---|---|
| නගර සභා ආඥා පනත | | |
| පරිච්ඡේදය - 255<br>වගන්තිය - 76(1) | - | අනවසර ගොඩනැගිලි 13 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 571 | - | 2010 වර්ෂයේදි ගොඩනැගිලි සංකීරණය වෙළඳ කුටි වෙන් කරදීම සඳහා අයකළ රු.6,302,092 සම්බන්ධයෙන් කළයුතු කර නොතිබුණි. |
| නගර සභා මුදල් රෙගුලාසි 1939 | | |
| පරිච්ඡේදය V<br>වගන්තිය 168 | - | සභා අත්තිකාරම් ලේඛනයේ එක් එක් පුද්ගලයන් සඳහා වෙනම පිටු වෙන්කර පවත්වා නොතිබුණි. |
| පරිච්ඡේදය V<br>වගන්තිය 176 | - | තැන්පතු ලේඛණයේ දැක්වෙන ශේෂ ප්‍රධාන ලෙජරයේ දැක්වෙන ශේෂ සමග සසඳා නොතිබුණි. |

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය
-------------------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
---------------
ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ වලට අනුව නගර සභාවේ සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.34,404,489 ක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,030,071 ක් විය.

2.2 මූල්‍ය පාලනය

------------------

අයවැය විධිමත්ව පිළියෙල නොකර තිබූ නිසා අයවැයගත ආදායම සහ තත්‍ය ආදායම අතර රු.33,254,275 ක වෙනසක් ද අයවැයගත වියදම සහ තත්‍ය වියදම අතර රු.13,047,873 ක වෙනසක් ද විගණනයේදී නිරීක්ෂණය විය.

2.3 ආදායම් පරිපාලනය

-----------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම සහ හිඟ ආදායම

-------------------------------------------------------------

සභාපති විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම සහ හිඟ ආදායම පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තත්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ ශේෂය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 967 | 1,056 | 3,212 |
| බදුකුලී | 11,767 | 26,896 | - |
| බලබත්‍ර ගාස්තු | 1,086 | 1,227 | 97 |
| වෙනත් ආදායම් | 44,540 | 62,434 | 25,668 |

2.3.2 ආදායම් කළමනාකරණය

----------------------------

වරිපනම් සහ බදු, බදු කුලි, බලපත්‍ර ගාස්තු වශයෙන් සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා ලැබිය යුතු හිඟ මුදල් රු.4,265,527 ක් අයකර ගැනිම සඳහා භෞතික හා වෙනත් ඵලදායි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

2.3.3 උසාවි දඩ මුදල්

-----------------

2011-2013 කාලපරිච්ඡේදය සඳහා පේදුරුතුඩුව මහේස්ත්‍රාත් උසාවියෙන් ලැබිය යුතු රු.4,193,000 ක් වූ උසාවි දඩ මුදල් අයකර ගැනිම සඳහා ඵලදායි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

2.3.4 මුද්දර ගාස්තු

-----------------

2010, 2011, 2012 සිට 2013 වර්ෂය දක්වා ලැබිය යුතු රු.44,128,203 ක් වූ මුද්දර ගාස්තු මෙම වාර්තාවේ දින දක්වාම අයකර නොතිබුණි.

2.4 වත්කම් කළමනාකරණය

2.4.1 අක්‍රිය සහ ඌන උපයෝජිත භෞතික සම්පත්

වාහන උපයෝජනය

(i.) සමාලෝචිත වර්ෂය තුලදී වාහන තුනක් අක්‍රියව පැවතුණි.

(ii.) වාහන දෙකක ඉන්ධන පරිභෝජනය, එම වාහන වල සැතපුම් මාපක හානි වී තිබූ බැවින් විගණනයේදී පරික්ෂා කළ නොහැකි විය.

2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

2010 වර්ෂයේදී සභාවේ සංවර්ධනය සඳහා පළාත් පාලන කොමසාරිස් විසින් සභාවට දෙන ලද රු.587,091 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන සමාලෝචිත වර්ෂය අවසාන වනතෙක්ම භාවිතා නොකර බදු තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි.

2.6 කොන්ත්‍රාත් පරිපාලනය

(i.) ක්‍රියාත්මක නොකළ ව්‍යාපෘති

සමාලෝචිත වර්ෂය තුලදී ක්‍රියාත්මක කළ යුතුව තිබූ රු.16,295,700 ක් සඳහා වූ ව්‍යාපෘති 10 ක් ඒවා ක්‍රියාත්මක නොකර විවිධ ණයගැති ගිණුමට ඇතුලත් කර තිබුණි.

(ii.) අනුමැතියක් නොමැති ව්‍යාපෘති

අයවැය මගින් අනුමත නොකළ ව්‍යාපෘති 5 ක් සඳහා සභා අරමුදලෙන් රු.3,316,796 ක් වැයකර තිබුණි.

3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය අවශ්‍ය වේ.

(අ) ආදායම් එකතු කිරිම
(ආ) අයවැය
(ඇ) වාහන උපයෝජනය
(ඈ) විවිධ ණයගැතියන්
(ඉ) තැන්පතු ගිණුම